**වරකාපොළ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වරකාපොළ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වරකාපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල රු.100,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහනක් යොදා නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | කාර්යාල ගොඩනැගිල්ලේ රු.245,550ක් වූ මූලධන ඉදි කිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ලද විනෝද බදු ආදායම් රු.372,500 ක් පොදු තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි. | විනෝද බදු අඩු කිරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ තීරණය ලද පසු ආදායමට ගන්නා බව. | - එම - |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අනුව ශේෂ අතර රු.9,605,066ක වෙනසක් පැවතිණි. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බවත් | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | ගිණුම් විෂයයන් 04ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂ අතර රු.708,944ක වෙනසක් පැවැතිණි. | ජ'නල් සටහන් යොදා නිවැරදි කර ඇති බව. | - එම - |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 172,388,657 ක් වූ ගිණුම් විෂයයන් 07ක් සඳහා ලේඛන, උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන සකස් කිරීමට කටයුතු කරන බවත් | ස්ථාවර වත්කම් ලේඛන,උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

**1.6.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආගිය ගමන්වල අවශ්‍යතාව පිළිබඳ කිසිදු තහවුරු කිරීමකින් තොරව හිටපු සභාපතිවරයාට සහ රියදුරු දෙදෙනෙකුට 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.723,200 ක ගමන් වියදම් ගෙවා තිබුණි. | සභාපතිතුමන්ගේ රාජකාරි ගමන්වල අවශ්‍යතාව නොපවසන බැවින් ගමන්කළ ස්ථානය පමණක් ධාවන සටහන් පොතේ සටහන් කරන බව. | ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි මත ගෙවීම් කළ යුතු වේ. |
| (ආ) | 2020 ජනවාරි සිට 2023 මාර්තු කාල සීමාව තුළ දී හිටපු සභාපතිවරයා සහභාගි වූ කමිටු රැස්වීම් දින 37ක දී කැබ් රථය කිලෝමීටර් 4,300 ක් ධාවනය කිරීම වෙනුවෙන් රු.66,132ක ඉන්ධන සහා අරමුදලින් ලබාගෙන තිබුණි. කමිටු රැස්වීම දින 37 දී සම්පූර්ණ රාජකාරි කාලයම කාර්යාලයෙන් බැහැරව සිටි බව ධාවන සටහන්වල දක්වා තිබුණි. | රථය කාර්යාලයේ පවතින අවස්ථා හා රාජකාරි ගමන් වෙන්කර ධාවන සටහන් පොතේ සටහන් කිරීමේදී සිදුවූ අතපසු වීමේ වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | - - එම - |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් රු.469,631 ක් වූ අග්‍රිම 19 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. ඒ තුළ 2021 හා 2022 | මේ වනවිට පියවීමට කටයුතු කොට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | වර්ෂවලට අදාළ නොපියවා තිබූ රු.72,845ක් වූ අග්‍රිම 03 ක් ද විය. | | |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02ක් ගත වූ රු.1,394,176ක තැන්පතු 103 ක් නිරවුල්කර නොතිබුණි . | තැම්පතු 46ක් ආදායමට ගැනීම, රු.119,500ක තැම්පතු 4ක් තවදුරටත් තබා ගැනීම, තැම්පත් 04ක් ලේඛන දෝෂ ලෙස හදුනාගෙන නිවැරදි කිරීම සිදුකර ඇති බවත් අනෙකුත් ගිවිසුම් තැම්පත් වර්ෂ අවසානයේ නිදහස් කිරීම හෝ හිලව් කිරීම සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | චක්‍රලේඛ | | | |
| (i) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ සංග්‍රහයේ අංක 03/2010 දරන චක්‍රලේඛයේ 13 ඡේදය | අනවසර ඉදිකිරීම් 09කට එරෙහිව කටයුතු කර නොතිබුණි. | පසු විපරම් කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 08 හා 1993 මාර්තු 16 දිනැති අංක 05/01/150 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 14 | පළාත් පාලන ආයතනය සහ නාගරික සංවර්ධන අධිකාරිය නමින් ඒකාබද්ධ බැංකු ගිණුමක් විවෘත කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 ක දී පොදු රථ ගාලක් ඉදිකිරීම සඳහා අය කරන ලද සේවා ගාස්තු රු.500,000ක් පොදු තැන්පත් යටතේ රඳවාගෙන තිබිණි. | අදාළ ගිණුම විවෘත කළ පසු පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදල් අදාළ ගිණුමට බැර කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 204 වගන්තිය | භාණ්ඩ ඌනතා වටිනාකම අදාළ නිලධාරියා වෙතින් අයකර ගැනීමටත්, අතිරික්තයක් පොත්වලට ගැනීමටත් කටයුතු කළ යුතුය. එහෙත්, 2023 අගෝස්තු වන විට රු.117,160 ක් වූ භාණ්ඩ | අතිරික්ත භාණ්ඩ ලේඛනගත කර ඇති අතර ඌන භාණ්ඩ අදාල පුද්ගලයින්ගේ අය කර ගැනීමේ කටයුතු සිදු කර ඇති බව. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඒකක 325 ක ඌනතාවක් ද රු.1,567,430 ක් වූ ඒකක 539 ක අතිරික්තයක් ද පැවැතිණි. | | |
| (ii) | 178 (2) (2) (අ) රීතිය | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව ටෙන්ඩරයක් ක්‍රියාත්මක කර පසුව අවස්ථා 02ක දී රු.3,037,225ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකර තිබුණි. එය එම වැය විෂය සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76 ක් විය. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව වැය මාරු කිරීම සඳහා බලය සභාවේ ලේකම්වරයා සතුවන බව | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,968,619 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,418,099 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,984,000 | 8,814,167 | 6,299,993 | 7,781,796 | 9,045,000 | 8,180,703 | 7,509,630 | 4,613,491 |
| කුලී | 20,896,515 | 5,588,033 | 13,931,276 | 1,805,805 | 26,806,647 | 12,164,136 | 12,110,966 | 839,276 |
| බලපත්‍ර ගාස්තු | 3,396,000 | - | 1,317,387 | 332,900 | 3,549,100 | 1,286,595 | 1,320,145 | 2,950 |
| වෙනත් ආදායම් | 15,299,180 | 1,061,861 | 10,851,326 | 955,345 | 9,030,000 | 10,943,014 | 8,086,125 | 508,042 |
| | 47,575,695 | 15,464,062 | 32,399,984 | 10,875,846 | 48,430,747 | 32,574,449 | 29,026,868 | 5,963,760 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ආයතන 26 කින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.148,701ක වරිපනම් හා අක්කර බදු අයකර නොතිබුණි. | රාජ්‍ය ආයතන දැනුවත් කර ඇත. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු.3,930,194ක් වූ හිඟහිටි වරිපනම් ශේෂය තුළ වසර 05ට වැඩි රු.325,494 ක ශේෂ විය. | හිඟ මුදලක් කපා හැරීමට යෝජිතව ඇති අතර ඉතිරි මුදලද ඉක්මනින් අයකර ගන්නා බව. | හිඟ ආදායම් අය කළ යුතු වේ. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු.182,815ක් වූ හිඟහිටි වරිපනම් ශේෂය තුළ වසර 05ට වැඩි රු.146,879 ක ශේෂ විය. | - එම - | - එම - |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග ලෙස ලද ජල මීටර් 50 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනා ගැනීමට කටයුතු සිදු කරමින් සිටින බව. | වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අධිකරණ තීන්දුවක් මත දේපළක අයිතිය සභාවට අහිමි වී තිබුණි. මේ නිසා එම භූමියේ ඉදි කර තිබූ මස්කඩ 03 අයිතිය ද සභාවට අහිමි වී තිබුණි. | අහිමි වී ගිය කඩ කාමර වෙනුවට සතිපොල භූමිය තුළ නව කඩ කාමර 3ක් අලුතින් ඉදිකර 2024 වර්ෂයට ටෙන්ඩර් ලබා දී ඇත. | සභාව සතු දේපළවල අයිතිය රැක ගත යුතු වේ. |
| (ඇ) | අනවසර ඉදිකිරීම් 09 ක් සම්බන්යෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පසු විපරම් කර ඉදිරි පියවර ගන්නා බව. | අනවසර ඉදි කිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට වූ රු.8,968,875ක ණයහිමි ශේෂය තුළ වසර 05ට වැඩි රු.1,011,285 ක ශේෂ විය. | ඉදිරියේ දී නිරවුල් කරන බව. | නිරවුල් කළ යුතු වේ. |

**3.2මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිනමා ශාලාවකින් 2019 වර්ෂයේ සිට හිඟහිටි රු.163,306 ක විනෝද බදු මුදල් අයකර නොතිබුණි. | නඩු පැවරීමට කටයුතු කර ඇති බව. | ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. |
| (ආ) | ස්ථාන 29 ක් බදු දීමට අපොහොසත් වීම නිසා 2023 වර්ෂයේදී රු.3,488,625 ක ආදායමක් අහිමි වී තිබුණි. | තෙවන වරටත් ටෙන්ඩර් කළ ද ටෙන්ඩර් නොවූ බව. | - එම - |
| (ඇ) | වාර්ෂිකව රු.2,000,000 ක ආදායමක් අපේක්ෂාවෙන් රු.3,824,232ක් වැයකර ඩිජිටල් නාම පුවරුවක් 2019 වර්ෂයේ ස්ථාපනය කර තිබුණද, 2021 හා 2022 වර්ෂවල දී රු.370,000ක් පමණක් උපයා තිබුණි. මෙම දැන්වීම් පුවරුවට අදාළ විෂය ලිපිගොනුව ද අස්ථානගත වී තිබුණි. | ලිපි ගොනුව අස්ථානගත වීම පිළිබඳව මේ වන විට පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. | - එම - |

**3.3වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ තක්සේරුව ලබා ගැනීම වෙනුවට ලේකම් ඇතුළු කමිටුවක් මඟින් සිදුකළ තක්සේරුවක් මත ඉඩම් ගොඩනැගිලි 209 ක් සඳහා රු.125,171,911ක වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි. | 2017 අංක 16 දරන 04/2017 චක්‍රලේඛ ප්‍රකාරව 2025 වර්ෂයේ දී වත්කම් සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ට්‍රැක්ටරයක් 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණද, අපහරණය කර නොතිබුණි. | ලියාපදිංචි සහතිකය ලබා දුන් වහාම ඉදිරි කටයුතු කරන බව. | අපහරණ කටයුතු නිසි පරිදි කළ යුතු වේ. |
| (ඇ) | යන්ත්‍ර හා උපකරණ ඒකක 05 ක් වර්ෂ ගණනාවක සිට මායින්නොළුව මහජන පුස්තකාලය ඉදිරිපිට දිරාපත් වෙමින් පවතී. | මෙම යන්ත්‍ර උපකරණ අපහරණය හෝ අලුත්වැඩියා කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සභාවේ නිෂ්පාදිත පොහොර කිලෝ ග්‍රෑම් 22,486 ක් 2023 අගෝස්තු මාසය වන විට විකිණීමට හෝ වෙනත් ඵලදායි කාර්යයක් සඳහා යෙදවීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි. | බාහිර ආයතන වෙත අලෙවි කිරීමට කටයුතු කර ඇති බවත් විවිධ ව්‍යාපෘති හරහාද පොහොර ලබා දීමට කටයුතු කරන බව. | පොහොර විකිණීමට හෝ වෙනත් ඵලදායි කාර්යයක් සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම 2022 වර්ෂයේදී දෙපාර්ශවයේම එකඟතාව මත රු.23,811,882ක නිම් වැඩ වටිනාකමක් සහිතව වැඩ අවසන් කර තිබුණ ද, ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ අවසන් කර නොමැති වීම හේතුවෙන් 2024 අප්‍රේල් 25 දින වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවැතිණි. | දෙවන අදියර සඳහා රු.57,500,982ක වටිනාකමින් යුත් ඇස්තමේන්තුවක් සකස් කර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇති බව. | ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ අවසන් කළ යුතු වේ. |
| (ආ) | කැටගොඩේ වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට යාබදව නව කසළ අංගනයක් ඉදිකිරීම සඳහා 2022 ජූලි මාසයේදී රු.1,325,903 ක් ගෙවා අත්තිවාරමක් පමණක් යොදා ඉදි කිරීම් හැර දමා ඇති බැවින් දැනට මෙම ස්ථානය වල් බිහි වී පවතී. | පළාත් සභා ප්‍රතිපාදන වෙන් වී ඇති අතර මෙම වසරේ දී එහි ඉදි කිරීම් අවසන් කිරීමට හැකි බව. | ඉදි කිරීම් කඩිනමින් අවසන් කළ යුතු වේ. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයෙන් 2023 ජූනි 30 දිනට පුරප්පාඩු 25 ක් සහ තනතුරු 01 ක අතිරික්තයක් පැවැතිණි. ශ්‍රම හා අනියම් පදනම මත සේවකයින් 17 දෙනෙකු ද, දරන්නාට පෞද්ගලික වනසේ සේවකයින් 20 දෙනෙකු බඳවාගෙන තිබුණි. | 2013 වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලයෙන් කටයුතු කිරීම අපහසු වීම හා අඛණ්ඩව සේවා සැපයීමේ අවශ්‍යතාව මත ශ්‍රම පදනමින්, අනියම් පදනමින් හා දරන්නාට පෞද්ගලික වන සේ සේවකයන් බඳවා ගෙන ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අනුමත සේවක සංඛ්‍යාව තුළ වූ සෞඛ්‍ය හා ක්ෂේත්‍ර කම්කරුවන් 15 දෙනෙකු, කාර්යාල සේවකයින් 02 දෙදෙනෙකු, පුස්තකාල සහායකයින් 03 දෙනෙකු සහ මුරකරුවෙකු 2013 වර්ෂයේ සිට මේ දක්වා අතර කාලය තුළ අදාළ කාර්යයට නොයොදවා වෙනත් සේවාවල යොදවා තිබුණි. | ආදාහනාගාරය, පෙර පාසල්, විදුලි අංශය, රියදුරු, ජල ව්‍යාපෘතිය, ආයුර්වේද කටයුතු, ආදායම් පරීක්ෂක තනතුරු වල පුරප්පාඩු පැවති නමුත් සම්පූර්ණ කර නොතිබීම සහ අත්‍යාවශ්‍ය සේවා බැවින් වෙනත් තනතුරු වල නිලධාරීන් අනියුක්ත කර සේවා ඉටු කිරීමට සිදු වූ බව. | නිශ්චිත කාර්යයකට බඳවාගත් සේවකයන් එම කාර්යයට යොදවා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටි රීතිවල 203 රීතියට පටහැනිව, නිලධාරීන් 19 දෙනෙකු වසර 06ත් වසර 23 ත් අතර කාලයක සිට ස්ථාන මාරු වීම් නොලබා අඛණ්ඩව එකම ස්ථානයේ සේවය කරමින් සිටි. | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීම , අනුප්‍රාප්තිකයා නොපැමිණීම වැනි හේතු මත සමහර නිලධාරීන් හට ස්ථාන මාරු වීමට නොහැකි වූ බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටි රීති ප්‍රකාරව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් දෙදෙනෙකුගේ අයවිය යුතු රු.105,305 ක ණය ශේෂය වසර 02 සිට වසර 13 දක්වා කාලයක් පැරණි විය. | එක් ණය ශේෂයක් පාරිතෝෂිකයෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර, අනිත් ශේෂය කපා හැරීම සඳහා ඉදිරිපත් කර ඇති බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |